**ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 20 දින රජයේ මුද්‍රණාලයාධිපති වෙත නිකුත් කර ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,006.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,936.06 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 70.79 ක් හෙවත් සියයට 3.53 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,833.83 | 1,789.63 | 44.20 | 2.41 |
| මූලධන | 173.02 | 146.43 | 26.59 | 15.37 |
| **එකතුව** | **2,006.85** | **1,936.06** | **70.79** | **3.53** |

**2.2** **ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා 20.03.02.05 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 520.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 690.33 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 170.33 කින් හෙවත් සියයට 32.76 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

**2.3** **අත්තිකාරම් ගිණුම**

**2.3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 21101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **යදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 56.15 | 43.83 | 44.15 | 54.07 | 275.00 | 205.25 |

**2.4** **අග්‍රිම ගිණුම**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0104/0015/000 දරන අග්‍රිමයේ ශේෂය රු.මිලියන 1.09 ක් විය.

**2.5** **පොදු තැන්පත් ගිණුම**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ වල එකතුව රු.මිලියන 64.16 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0013/0035/000 | 17.25 |
| 6000/0000/00/0018/0003/000 | 42.24 |
| 6000/0000/00/0002/0050/000 | 4.67 |
| **එකතුව** | **64.16** |

## 2.6 විගණන නිරීක්ෂණය

----------------------

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

--------------------------------------------

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### 3.2 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

-------------------------------------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව ප්‍රකාරව 211-1-1-1205 වැය විෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන සළසා නොතිබුණත්, වර්ෂය අවසාන වන විට එම වැය විෂය වෙනුවෙන් රු.මිලියන 15.92 ක බැරකම්වලට එළඹ තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.මිලියන 1.09 ක අග්‍රිම ශේෂය දෙපාර්තමේන්තුව විසින් 2016 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි.

### 3.4 පොදු තැන්පත් ගිණුම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 6000/0000/00/0015/0093/000 දරන විවිධ තැන්පත් පැරණි ගිණුම හා අංක 6000/0000/00/0002/0004/000 දරන ටෙන්ඩර් තැන්පත් පැරණි ගිණුම් දෙකෙහි 2014 දෙසැම්බර් 31 දිනට වූ එකතුව රු.මිලියන 165.19 ක් වූ ශේෂ එකතුව වෙනුවට සමාලෝචිත

වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.මිලියන 51.81 ක් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.මිලියන 113.37 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) තැන්පත් ගිණුමේ ශේෂයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව වෙනස්කම් අනාවරණය වී තිබුණත්, මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව කටයුතු කර එම වෙනස්කම් 2015 දෙසැම්බර් 31 දින වන විටත් සසඳා නොතිබුණි.

## 3.5 ආදායම් ගිණුම

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 01 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව 2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම රු.මිලියන 861.81 ක් වී තිබුණි. එම හිඟහිටි ආදායමෙන් රු.මිලියන 127.98 ක් 1989 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා වූ කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, ඉන් කිසිදු ආදායමක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2003, 2005, 2008, 2009, 2011 හා 2013 යන වර්ෂවල හිඟහිටි ආදායමින් සමාලෝචිත වර්ෂයේදි රු.මිලියන 7.64 ක් හෙවත් මුළු හිඟහිටි ආදායමින් සියයට 6.8 ක ප්‍රමාණයක් පමණක් අයකර ගෙන තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට පෞද්ගලික අංශයෙන් අයවිය යුතු රු. මිලියන 9.51 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා 2008 ජුනි 24 දිනැති අංක එන්සී/6/71/2/1 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපියේ උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිටව තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 6.13 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ වර්ෂ 3 ක සිට වර්ෂ 5 ක් අතර කාල පරාසයක සිට පැවත එමින් තිබුණද, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) වසර 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 426,332 ක් වූ 2015 දෙසැම්බර් 31 දින වන විට මිය ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ අදාළ ඇපකරුවන්ගෙන් හෝ පාරිතෝෂිකයෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 1 ක සිට වර්ෂ 3 ත් අතර කාල පරාසයක සිට පැවත එමින් තිබුන රු.මිලියන 1.19 ක් වූ විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 3.7.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුලි 12 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.7.2 විගණන හා කළමනාකරන කමිටුවේ රැස්වීම් පැවැත්වීම

විගණන හා කළමනාකරන කමිටුවේ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා එක් රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

## 3.8 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත දක්වා ඇති වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව විගණන පරික්ෂණවලදි අනාවරණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම<br>රු. | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|
| ස්වයංක්‍රිය ගේට්ටු පද්ධතිය | 02 | 2,951,179 | වර්ෂ 1 කට වැඩි |
| Kord 05 මුද්‍රණ යන්ත්‍රය | 01 | නිශ්චය කළ නොහැක | වර්ෂ 16 කට වැඩි |
| Postcard rotary යන්ත්‍රය | 02 | නිශ්චය කළ නොහැක | වර්ෂ 01 කට වැඩි |
| Mo 1 - one color යන්ත්‍රය | 01 | නිශ්චය කළ නොහැක | මාස 6 කට වැඩි |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2016 මැයි 23 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.9** **අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත** | - | වායුසමීකරණ යන්ත්‍ර 51 ක් සැපයීමට ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන් කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කර තිබුණු ලංසුකරුවන් බව තහවුරු කර ගෙන නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| V වන පරිච්ඡේදයේ 1.1 වගන්තිය | - | හිටපු නියෝජ්‍ය මුද්‍රණාලයාධිපතිවරයෙක් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ රාජකාරී සඳහා මුදාහැර තිබුණද, යොමුගත වගන්තිය ප්‍රකාරව එම මුදාහැරීම සඳහා පත්වීම් බලධාරියා වෙත ඉල්ලීමක් කර නොතිබුණි. |
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 770 | - | ක්‍රියාත්මක තත්ත්වයේ පවතින වායුසමීකරණ යන්ත්‍ර 45 ක් ඉවත් කිරිමට වැඩබලන මුද්‍රණාලයාධිපති විසින් අනුමැතිය ලබා දී තිබුණත්, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් විසින් එම වායු සමීකරණ යන්ත්‍ර විකිණීමට හෝ විනාශ කිරිමට නිර්දේශ කර නොතිබුණි. |
| **(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 වන ඡේදය. | 19,031 | 2015 ජනවාරි 01 දින සිට 2015 ජනවාරි 20 දින දක්වා වැඩබලන මුද්‍රණාලයාධිපති ලෙස කටයුතු කළ නියෝජ්‍ය මුද්‍රණාලයාධිපති වෙනුවෙන් මාසික ඉන්ධන දීමනාවට අමතරව නිල රථය සඳහා පෙට්‍රල් |

| | | | |
|---|---|---|---|
| | | | ලීටර් 162.66 ඉන්ධන ඇනවුම්පත් මගින් ලබා දී තිබුණි. ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ii) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1 ඡේදය. | 322,458 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් (කම්කරු සබඳතා) තනතුරට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ගණින්නා හා අසුරන්නා ලෙස සේවය කළ නිලධාරියෙකු 2015 මැයි 15 දින නැවත අනුයුක්ත කර තිබුණි. ඔහුගේ පරිහරණය සඳහා දෙපාර්තමේන්තුව සතු වාහනයක් මුදාහැර ඒ සඳහා රියදුරන් දෙදෙනෙකු අනුයුක්ත කර වැටුප්, දීමනා හා අතිකාල දෙපාර්තමේන්තුවෙන් ගෙවා තිබුණි. |

## 3.10 කාර්යසාධනය

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විෂයයන් 3 කට අදාල වර්ග 5 ක පාසල් පෙළ පොත් 795,500 ක මුද්‍රණ කටයුතු දින 3 ක සිට දින 113 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර මුද්‍රණය කර තිබුණි. එසේ ප්‍රමාද වූ මුද්‍රණ කටයුත්තේ ඉන්වොයිස් වටිනාකම රු.මිලියන 35.16 ක් වී තිබුණි.

(ආ) 2015 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා වූ කාලපරිච්ඡේදයේදී ගැසට් පත්‍රය මුද්‍රණය කර බෙදාහැරීම පිළිබද සිදුකළ පරීක්ෂාවේදී එම මුද්‍රණ කටයුත්ත හා බෙදාහැරීමේ කටයුතු දින 5 ක සිට දින 45 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සිදුකර තිබුණි.

## 3.11 අවිධිමත් ගනුදෙනු

----------------------

**වායු සමීකරණ යන්ත්‍ර 48 ක් මිලදී ගැනීම**

------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව තුළ සවිකර තිබූ එක් වායු සමීකරණ යන්ත්‍රයක් ගිනිගෙන විනාශ වීම මත පදනම්ව ,තාක්ෂණික ඇගයීමක් සිදු නොකර වායු සමීකරණ යන්ත්‍ර 45 ක් භාවිතයට නුසුදුසු බව තීරණය කර , වායු සමීකරණ යන්ත්‍ර 48 ක් රු. 7,008,073 කට මිලදී ගෙන තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ඉහත මිලදී ගැනීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද, මෙම මිලදී ගැනීම සඳහා සැපයුම්කරු සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 41 (2) ප්‍රකාරව වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීමේදී අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**3.12 පාඩු හා හානි**

**-------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අතිරික්තව මුද්‍රණය කරන ලද හා පළුදු වූ වටිනාකම ගණනය කළ නොහැකි මුද්දර තොගයක් 2010 වර්ෂයේ සිට රහස් මුද්දර අංශයෙහි රඳවාගෙන තිබුණි.

(ආ) 2002, 2011, 2012 සහ 2014 වර්ෂවල දෙපාර්තමේන්තුවේ වාහනවලට අනතුරු 7 කින් රු.මිලියන 0.35 ක අලාභහානි සිදු වී තිබුණි. එම අලාභහානි අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනිමට හෝ පොත්වලින් කපා හැරිමට හෝ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 24'' – 80 GSM මුද්‍රණ කඩදාසි මෙ. ටො. 50 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික පිරිවිතරයන් හෝ කාර්මික තාක්ෂණික ආයතනයේ වාර්තා ඉදිරිපත් නොකළ සියළු ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. ආයතනයට අවශ්‍ය තාක්ෂණ පිරිවිතරය වූ ජලය අවශෝෂණ අගය 22gm2 ඉක්මවා තිබූ හතරවන අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය තෝරා ගැනීම හේතුවෙන් රු.371,823 ක මූල්‍යමය පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණි.

**3.13 අනාර්ථික ගනුදෙනු**

**--------------------**

පාර්ලිමේන්තුවට අවශ්‍ය දින පොත් සැකසීම සඳහා දින පොත් කවර 4100 ක් මිලදි ගෙන තිබුණද, පාර්ලිමේන්තුව වෙත භාර දී තිබුණ දින පොත් ප්‍රමාණය 3026 ක් වූයෙන් අතිරික්තව මිලදි ගෙන තිබූ දින පොත් කවර 1074 ක් වෙනුවෙන් රු. 65,890 ක් වැයකර තිබුණි.

**3.14 කළමනාකරණ දූර්වලතා**

**------------------------**

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රහස්‍යභාවය සහ ආරක්ෂිතව මුද්දර මුද්‍රණය කිරීම කළ යුතු වුවත්, වර්තමානයේ මුද්දර මුද්‍රණය කරනු ලබන යන්ත්‍රය ස්ථාපිත කර ඇති වැඩබිම තුළට අනවසර ප්‍රවේශය වලක්වන කිසිදු ආරක්ෂිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. මුද්දර මුද්‍රණය සඳහා වන ආරක්ෂිත කඩදාසි ( Security Papers ) ගබඩා කර තිබූ කාමරයද අගුළු දමා නොතිබුණි.

(ආ) 1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥා පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ගිණි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. ගින්නක් හටගත් අවස්ථාවකදී ඉන් ආරක්ෂාවීමේ ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් පුහුණුවක් ද සේවකයන්ට ලබා දී නොතිබුණි. 2004 ජුලි මාසයේදී දෙපාර්තමේන්තුව තුළ ගින්නක් හට ගෙන තිබූ අතර 2009 සැප්තැම්බර් 11 දින රැස්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් එම ගින්නෙන් වූ සම්පූර්ණ හානිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි.

## 3.15 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 18 | 19 | - |
| (ii) | තෘතියික මට්ටම | 08 | 02 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,234 | 669 | 565 | - |
| (v) | ප්‍රාථමික මට්ටම | 694 | 529 | 165 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම ) | - | 08 | - | 08 |
| | **එකතුව** | **1,973** | **1,226** | **755** | **08** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 755 ක් පැවති තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු නොකර, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබු නිලධාරින් 8 ක් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 2. 32 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | විධායක මට්ටම | 01 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සඳහන් කර නොමැත. |
| (ii) | තෘතියික මට්ටම | 01 | - එම - | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ අමාත්‍ය ධූරය දරන කාලය දක්වා. |

(ඇ) ඉහත ආ(i) හි සඳහන් වැඩබලන රජයේ මුද්‍රණාලයාධිපති ලෙස සේවය කළ නිලධාරියෙකු නිශ්චිත තනතුරක් සඳහන් නොකරමින් 2015 ජනවාරි 21 දින සිට පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අතර එම නිලධාරියා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි වැටුප්, දුරකථන දීමනා, ඉන්ධන දීමනා සහ අනෙකුත් දීමනා ලෙස රු.මිලියන 1.23 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.